සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

# 13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2024
## தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2024 / Grade 13 Final Term Test - 2024

**නර්තනය - I** | 13 | S | I | කාලය / நேரம் / Time } පැය 2 යි

නම / பெயர் / Name } ..............................................................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } .....................................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. " නෘත්‍ය රත්නාකරය " සහ "සිංහල තිත් තාල ක්‍රමය" යන කෘතීන් රචනා කරන ලද්දේ ,
  1. තිස්සකාරියවසම් සහ ඩබ්.බී.මකුලොලුව විසිනි.
  2. කේ.එස්.ප්‍රනාන්දු සහ රද්දැල්ලේ පොඩි මහත්මයා විසිනි.
  3. ජේ.ඊ.සේදරමන් සහ ජයසේන කෝට්ටගොඩ විසිනි.
  4. ඩබ්.බී.මකුලොලුව සහ සරත් විජේවර්ධන විසිනි.
  5. ජේ.ඊ.සේදරමන් සහ සරත් විජේවර්ධන විසිනි.

02. උඩරට , පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් ශාන්ති කර්ම පෙළපාලින් අනුපිළිවෙළින්,
  1. කාලියාම , කීල බැඳීම හා හාතා යක්කම
  2. යක් ඇණුම , දේව කෝල්පාඩුව හා නූගේ සැහැල්ල
  3. කපුයක්කාරිය , ආලත්ති තේවය හා කිරිරොටි දානය
  4. ගුරුගේ මාලාව , නානුමුරය හා දේව කෝල්පාඩුව
  5. මංගර සැහැල්ල , කුමාර සමයම හා හැන්දෑ සමයම

03. ශිව ගිරි හා සප්තගිරි යන කඳු හා සබැදි දේව ප්‍රබන්ධ මූලික කර බිහිවූ ද්‍රවිඩ ගැමි නැටුම වන්නේ ,
  1. කාවාඩි  2. කරගම්  3. කුම්මි  4. කෝලාට්ටම්  5. සෙම්බු

04. ග්‍රීක රංගභූමි ආකෘතිය අනුව ශ්‍රී ලංකාවේ නිර්මාණය කරන ලද්දේ ,
  1. ටවර් හෝල් රඟහලයි.
  2. එදිරිවීර සරච්චන්ද්‍ර එළිමහන් රංග පීඨයයි.
  3. නෙළුම් පොකුණ රඟහලයි.
  4. ලුම්බිණි රඟහලයි.
  5. එල්ෆින්ස්ටන් රඟහලයි.

05. දොං තකු දොං ජිං තක තරිකිට යන බෙර පදය වාදනය කරනුයේ,
  1. මාත්‍රා 2+2+3 තාල රූපයට ය.
  2. මාත්‍රා 3+4 තාල රූපයට ය.
  3. මාත්‍රා 2+2+2+4+4 තාල රූපයට ය.
  4. මාත්‍රා 3+3+4 තාල රූපයට ය.
  5. මාත්‍රා 2+2+4 තාල රූපයට ය.

06. ප්‍රසංග වේදිකාව සඳහා ගීත නර්තන නිර්මාණයේ දී වඩාත් අවධානය යොමු විය යුත්තේ ,
  1. වේගවත් සංගීතය හා සංචලන හැසිරවීමට ය.
  2. විචිත්‍ර ඇඳුම් පැළඳුම් හා රංගාලෝකය පිළිබඳව ය.
  3. උචිත ගීත හා උචිත සංචලන තෝරා ගැනීමට ය.
  4. පෙර අපර දෙදිග රංග විධි හා වේෂ නිරූපණයට ය.
  5. සංචලන හැසිරවීම හා ශිල්පීය ක්‍රම විධි පිළිබඳව ය.

07. " බෝ තොට මඩුවක් බිම පේ කරතී " මෙම ගායනය ,
  1. වරම් කවියකි.
  2. සුවිසිවිවරණ කවියකි.
  3. බඹර කවියකි.
  4. කරත්ත කවියකි.
  5. කිරි ඉතිරවීමේ කවියකි.

08. නර්තන සඳහා අංග රචනය සිදු කිරීමේදී ශිල්පියා විසින් වඩාත් සැලකිලිමත් විය යුත්තේ ,
   1. නර්තනයේ ස්වභාවය හා අමුද්‍රව්‍ය උපකරණ කෙරෙහි ය.
   2. ප්‍රේක්ෂක රුචිකත්වය හා කැමරාකෝණ පිළිබඳව ය.
   3. ශිල්පියාගේ මුහුණ හැඩය හා නර්තනයේ ස්වාභාවය කෙරෙහි ය.
   4. රංග වස්ත්‍රාභරණ හා පසුතල නිර්මාණ සම්බන්ධව ය.
   5. අංගරචන ශිල්ප ක්‍රම හා අමුද්‍රව්‍ය සම්බන්ධව ය.

09. කපාල කුඩුව , නවමාලේ පිදේනිය හා ගවරමල යන සැරසිලි අංග දැකිය හැක්කේ,
   1. රටයකුම , සන්නියකුම හා කිරිමඩුව යන ශාන්ති කර්මයන්හි ය.
   2. සන්නියකුම , රටයකුම හා වලියකුම යන ශාන්ති කර්මයන්හි ය.
   3. කුමාර සමයම , බලියාගය හා පූනාමඩුව යන ශාන්ති කර්මයන්හි ය.
   4. කුමාර සමයම ,රට යකුම හා කිරිමඩුව යන ශාන්ති කර්මයන්හි ය.
   5. වලියකුම , ගරා යකුම හා මහසොහොන් සමයම යන ශාන්ති කර්මයන්හි ය.

10. කථකලි හා කථක් නර්තනයේ උන්නතිය වෙනුවෙන් කටයුතු කළ කලාකරුවන් ලෙස සැලකෙන්නේ,
   1. රාම් ගෝපාල් හා රුක්මණී අරුණ්ඩේල් ය.
   2. උදය ශංකර් හා ක්‍රිෂ්ණ අයියර් ය.
   3. වල්ලතෝල් නාරායන මෙනන් හා බිර්ජු මහාරාජ් ය.
   4. මීනාක්ෂි සුන්දරම් පිල්ලේ හා බාල සරස්වතී ය.
   5. රවි ශංකර් හා උදය ශංකර් ය.

11. ශාන්තිකර්ම සැරසිලි ආශ්‍රිත කැටයම් නිර්මාණයේදී භාවිත අමුද්‍රව්‍ය ලෙස සැලකෙන්නේ,
   1. බුරුල්ල අතු , ගොප් කොළ හා හණ කෙඳි ය.
   2. තොලබෝ , හබරල හා ගහල කොළ ය.
   3. ගොප් කොළ , හබරල කොළ හා රඹ පතුරු ය.
   4. කෙසෙල් බඩ , බුරුල්ල අතු හා පුවක් අතු ය.
   5. කෙසෙල් බඩ , පුවක් කොළ හා ගොප් අතු ය.

12. චරිත නිරූපණයෙහි ලා ශුද්ධමාත්‍රය හා දෙතාලයේ පද කොටස් ඇසුරු කර ගන්නා කෝලම් චරිත වන්නේ,
   1. නොංචි හා ලෙංචිනා ය.
   2. අණබෙර හා නොංචි ය.
   3. ජසයා හා මුදලි ය.
   4. ආරච්චිල හා හේවා ය.
   5. ලෙංචිනා හා පොලිස් ය.

13. මෙම ඡායා රූපයේ දැක්වෙන රූකම අයත්වන යුගය ලෙස සැලකෙන්නේ,
   1. අනුරාධපුර යුගය
   2. ගම්පළ යුගය
   3. කුරුණෑගල යුගය
   4. පොළොන්නරු යුගය
   5. කෝට්ටේ යුගය



14. බලි ශාන්ති කර්මයට විශේෂිත වූ ගායන ලෙස සැලකෙන්නේ ,
   1. ඇඹුම් කවි , කඩතුරා කවි , සූවිසි විවරණ කවි
   2. හිං හතරේ කවි , සොළොස් මහලේ කවි , මල්යහන් කවි
   3. ග්‍රහ පන්ති කවි , ඇඹුම් කවි හා පිරිත් හුයේ කවි
   4. නව මාසේ කවි , සත්සතියේ කවි හා ජය මංගල කවි
   5. ඇඹුම් කවි , සිරස පාද කවි හා කිරි ඉතිරිවීමේ කවි

15. " අත්තන මල සේ ඇඳි සුදු සේලය ඉනවට රැළි අල්ලා " මෙහි
   1. ලඝු 16 ,ගුරු 05 හා සදැස්මක් 26 කි.
   2. ලඝු 18 ,ගුරු 04 හා සදැස්මක් 26 කි.
   3. ලඝු 20 ,ගුරු 03 හා සදැස්මක් 26 කි.
   4. ලඝු 12 ,ගුරු 08 හා සදැස්මක් 28 කි.
   5. ලඝු 12 ,ගුරු 04 හා සදැස්මක් 20 කි.

16. ගිනි සිසිල හා රට යකුමේ නානුමුරය මඟින් ප්‍රකාශිත භාවයන් වන්නේ,
    1. ශම හා රති ය.
    2. විස්ම හා රති ය.
    3. හාස හා උත්සාහ ය.
    4. බිය හා ක්‍රෝධ ය.
    5. රති හා හාස ය.

17. සාම්ප්‍රදායික දවුල් වාදනයේදී භාවිත කඩිප්පුවෙහි දිග ප්‍රමාණය ලෙස සැලකෙන්නේ,
    1. එක් වියත් එකඟුලකි.
    2. තුන් වියත් දැඟුලකි.
    3. දෙවියත් එකඟුලකි.
    4. මාපටගිල්ල හා දඹරගිල්ල අතර දුර මෙන් දෙගුණයකි.
    5. මාපටගිල්ල හා මැදගිල්ල අතර දුර මෙන් දෙගුණයකි.

18. සාම්ප්‍රදායික අමුද්‍රව්‍ය ඇසුරු කොට අංග රචනය සිදුකරන ශාන්ති කර්ම පෙළපාලීන් නම්,
    1. කුමාර පෙළපාලිය , වඩිග පටුන හා මරු සන්නිය
    2. මරු සන්නිය , කුමාර පෙළපාලිය හා හැන්දෑ සමයම
    3. වඩිගපටුන , කුමාර පෙළපාලිය හා සළු පාලිය
    4. නාග සන්නිය , දෙවොල් නැටීම හා වාහල නැටීම
    5. වෙඩි සන්නිය , අතු පාලිය හා මුගුරු පාලිය

19. භරත නාට්‍යම් හා කථක් යන සම්ප්‍රදායන්ගේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩ ලෙස සැලකෙන්නේ ,
    1. මෘදංගය හා පඛ්වාජය
    2. තබ්ලාව හා වෙන්ඩාව
    3. මෘදංගය හා තබ්ලාව
    4. පුං හා මද්දලය
    5. වෙන්ඩාව හා මෘදංගය

20. ' ඔඩෙට් හා ක්ලාරා ' යන චරිතයන් ඇතුළත් බැලේ නිර්මාණ කෘතී ලෙස සැලකෙනුයේ ,
    1. ද නට් ක්‍රැකර් හා රෝමියෝ ජුලියට් ය.
    2. හංසවිල හා නිදි කුමරිය ය.
    3. අවුරෝරා කුමාරයා හා ගිසෙල්ලි ය.
    4. හංස විල හා ද නට් ක්‍රැකර් ය.
    5. ගිසෙල්ලි හා රෝමියෝ ජුලියට් ය.

21. රංග වස්ත්‍ර නිර්මාණයේදී නිර්මාණ කරුවා වඩාත් අවධානය යොමු කළ යුත්තේ ,
    1. දේහ විද්‍යාත්මක සැකැස්ම පිළිබඳව ය.
    2. වර්ණ ,රේඛා හා හැඩතල පිළිබඳව ය.
    3. ආලෝක කරණය හා පසුතල පිළිබඳව ය.
    4. සම්ප්‍රදාය හා නර්තන නිර්මාණය පිළිබඳව ය.
    5. නව නිර්මාණාත්මකබව පිළිබඳව ය.

22. ශ්‍රී ලාංකේය සිනමා නර්තනය සම්බන්ධ ව දැක්වෙන සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
    1. වර්තමාන සිනමාත්මක නර්තනය දේශිය නර්තනයෙන් පෝෂණය වී ඇත.
    2. භාරතීය හා බටහිර නර්තන ලක්ෂණ සිනමා නර්තන තුළ ප්‍රදර්ශනය වේ.
    3. වර්තමාන චිත්‍රපට ක්ෂේත්‍රයේ රංගන ශිල්පින් නර්තන කුසලතාවන්ගෙන් යුක්ත අය වේ.
    4. ඉන්දියානු චිත්‍රපට නර්තනයේ ලක්ෂණ පුබලව දක්නට ලැබේ.
    5. දේශිය සංස්කෘතික ලක්ෂණ අද්‍යතන සිනමා නර්තනයෙන් ප්‍රදර්ශනය නොකරයි.

23. ශ්‍රීපාළි ආයතනය හා ගාන්ධර්ව සභාව පිහිටුවීමට පුරෝගාමී වූ කලාකරුවන් දැක්වෙන වරණය තෝරන්න.
    1. රබීන්ද්‍රනාත් තාගෝර් සහ මුදියන්සේ දිසානායක
    2. ජේ.ඊ. සේදරමන් සහ තිත්තවෙල ගුණයා
    3. විල්මට් ඒ පෙරේරා සහ එස්.එල්.බී.කපුකොටුව
    4. එස් පනීභාරත සහ ප්‍රේම කුමාර එපිටවෙල
    5. රබීන්ද්‍රනාත් තාගෝර් සහ ජේ.ඊ.සේදරමන්



A



B

24. ඉහත A හා B ජයාරූපයන් හි දැක්වෙන යක්ෂ චරිතයන් වන්නේ ,
    1. රීරි යක්ෂයා සහ අභිමාන යක්ෂයා ය.
    2. කළු යක්ෂයා හා තොට යක්ෂයා ය.
    3. මහාකෝල සන්නි යක්ෂයා හා රීරි යක්ෂයා ය.
    4. රීරි යක්ෂයා හා මහා කෝල සන්නි යක්ෂයා ය.
    5. අභිමාන යක්ෂයා හා මරු රීරි යක්ෂයා ය.

25. අනුපිළිවෙළින් උඩරට පහතරට සහ සබරගමු ඇඳුම් කට්ටලවලට ආවේණික කොටස් ලෙස සැලකෙන්නේ
    1. තෙල්කච්චිය ,ජටාව හා සිළුමිණ.
    2. අවුල්හැරය , තෙල්කච්චිය හා නෙත්තිමාලය.
    3. හස්ත කඩය ,හැඩ කැල්ල හා පබළු හැට්ටය.
    4. ජටාව ,පබළු ඉන හැඩය හා පායිම්පත.
    5. පොත්පොට , අත්පොට සතර හා නළල් පටිය.

- අංක 26 සිට 35 තෙක් ප්‍රශ්න වලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

26. ' ගුරුර් බ්‍රහ්මා ගුරුර් විෂ්ණු ගුරුර් දේවෝ මහේෂ්වර: ' මෙය .......................................... ශ්ලෝකය ලෙස හැඳින්වේ.

27. නර්තන රටා සැළසුම් කරමින් අවකාශය මත සංචලන අර්ථවත්ව පෙලගැස්වීම ........................................ නම් වේ.

28. ගම්පොළ යුගයේ රචිත ...................................................... සංදේශයේ දෙවුන්දර උපුල්වන් දේවාලය ආශ්‍රිත නර්තන පිළිබඳව වර්ණනා කොට ඇත.

29. වන්නකු රාළ ........................................................ ශාන්තිකර්මයේ සුවිශේෂ භූමිකාවකි.

30. පතහ විස්ස , මාලක්කම් හා බඹර වළල්ල යනු ........................................ නර්තන සම්ප්‍රදායේ භාවිත පැනීම් හා කැරකීම් විධි කිහිපයකි.

31. " ධි නා / ධි ධි නා / ති නා / ධි ධි නා " යන හින්දුස්ථානී ඣප්තාලය , දේශීය තිත් තාල ක්‍රමය අනුව ....................................................... දෙතිතට සමාන වේ.

32. බෙර වාදනයේදී බීජාක්ෂර පදනම් කර උපදින සෙසු අවනද්ධ අක්ෂර ............................................. හෙවත් අනු අක්ෂර නම් වේ.

33. පහතරට සින්දු වන්නම් ........................................ දේවාලය ආශ්‍රිතව රචනා වූ බව සඳහන් වේ.

34. ' බැරිසිල් ' මුද්‍රානාට්‍යයෙහි රංග වින්‍යාසය සැළසුම්කර ඇත්තේ .......................................... මහතා විසිනි.

35. භරත නාට්‍යම් සංදර්ශනයක නර්තන අංග අණුපිළිවෙළ ..................................................... නමින් හැඳින්වේ.

- අංක 36 සිට 50 තෙක් ප්‍රශ්න වලට අදාළ පිළිතුරු තිත් ඉරිමත ලියන්න.

36. " කුල්ලේ පිදේනිය " සම්බන්ධ වන ශාන්තිකර්මය හා එය අයත් නර්තන සම්ප්‍රදාය නම් කරන්න.

    1. ශාන්තිකර්මය - ........................................ 2. සම්ප්‍රදාය - ............................................

37. පහත A හා B රූපවල දැක්වෙන වෙස් මුහුණු භාවිත වන්නේ කුමන චරිත නිරූපණය කිරීම සඳහාද ?



A



B

1. A රූපය - ..............................  2. B රූපය - .....................................

38. අතීතයේ පැවැති ඓතිහාසික සටන් පදනම්ව ප්‍රබන්ධිත ප්‍රථම සටන් කාව්‍ය කෘතිය හා එහි කතුවරයා නම් කරන්න.

1.කෘතිය - .....................................  2. කතුවරයා - .....................................

39. අතිශයෝක්ති වර්ණනා සහිතව මහනුවර යුගයේදී රචනා වූ ගායන විශේෂය හා එය රජු ඉදිරියේ ගායන කළ පුද්ගලයන් සඳහන් කරන්න.

1.ගායන විශේෂය - ............................  2. පුද්ගයන් - .......................................

40. කර්ණාටක තාලපද්ධතියෙහි තාල හා ජාති සංඛ්‍යාත්මක වශයෙන් දක්වන්න.

1.තාල - .....................................  2. ජාති - ..............................................

41. අධ්‍යතන වන්නම් ලෙස සැළකෙන සිරිකත වන්නම හා මත්තිරි වන්නම නිර්මාණය කළ කලාකරුවන් නම් කරන්න.

1.සිරිකත වන්නම - .............................  2. මත්තිරි වන්නම - .................................

42. බලි යාගයේ පුද ලබන සෙනසුරු හා රාහු යන ග්‍රහයන්ට හිමි වර්ණයන් දක්වන්න.

1.සෙනසුරු - .......................................  2. රාහු - ...........................................

43. පොළොන්නරු යුගයේ දී සරස්වතිමණ්ඩපය සහ සැටදාගෙය ඉදිකළ රජවරුන් නම් කරන්න.

1.සරස්වතී මණ්ඩපය - .........................  2. සැටදාගෙය - .............................................


44. නර්තන කලාවේ ප්‍රභවය හා විකාශය පිළිබඳ තොරතුරු අනාවරණයේදී උපයෝගී කර ගන්නා සාධක දෙක දක්වන්න.

1............................... විද්‍යාත්මක සාධක  2.................................... විද්‍යාත්මක සාධක

45. පහත A හා B ඡායාරූපවලින් දැක්වෙන ශාන්තිකර්ම පෙළපාලින් නම් කරන්න.



A



B

1.A -  2. B –

46. බුලතා නම් යෝධයා මහත් ආයාසයෙන් කලුගල් ඔසවා ගෙනවිත් සාගරයක් බඳු වැවක් තැනුවේය.මෙම සිදුවීම මගින් මතුකෙරෙන භාවය හා රසය කුමක්ද ?

1.භාවය - ..........................................  2. රසය - ...............................................

47. වෙස් මෝස්තර නිර්මාණයේදී පුද්ගල අවශ්‍යතා සඳහා ආහාර්ය අභිනය යොදා ගන්නා ක්‍රම දෙක ලියන්න.

1.  2.

48. තාල සංකල්පයේදී ආඝාතය තැබීම සමඟ ගායනය ආරම්භ වීම හා ගායනයට පසු ආඝාතය තැබීම හැඳින්වෙන ග්‍රහ අවස්ථා නම් කරන්න.

1.ගායනය සමඟ -  2. ගායනයට පසු -

49. භරත නාට්‍යම් සම්ප්‍රදායේ ගුරුවරයා හා තාලවාද්‍ය භාණ්ඩය හැඳින්වෙන්නේ කෙසේද ?

1.ගුරුවරයා -  2. තාල වාද්‍ය භාණ්ඩය -

50. " ඈත කඳුකර හිමව් අරනේ " හා " ජීවිතයත් මුහුද වගේ " යන පසුබිම් ගීත දක්නට ලැබෙන මුද්‍රානාට්‍ය නම් කරන්න.

1. ඈත කඳුකර -  2. ජීවිතයත් මුහුද වගේ -

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2024

தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2024 / Grade 13 Final Term Test - 2024

# නර්තනය - II

13 | S | II

කාලය / நேரம் / Time } පැය 3 යි

නම / பெயர் / Name } ..........................................................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ......................................

- මෙම ප්‍රශ්න පත්‍රය I , II , III වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ.
- I කොටසේ 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ.
- II හා III කොටස් වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න දෙක ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුය.
- සෑම ප්‍රශ්නයක ම (I) කොටසට හා (II) කොටසට ලකුණු 06 බැගින් ද (III) කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 බැගින් හිමි වේ.

## I කොටස

01. i. පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා ගෙන ප්‍රස්තාර කරන්න.
   (අ) කුං දඩ කුං ජිං කඩතක ජිංතට ගජ් ජිං කඩ තක
   (ආ) ගත් ත ගදිත ගුගුදං ගදිත්තත් රෙගතත් දිකුදක දැහිම් දිතගත
   (ඉ) ජිං කුද කුද තත්කිට කිටිතක තත් කිටිතක තක්කිට කිටිතක

   ii. පහත සඳහන් කවිපදය මැදුම් මහ දෙතිතට අනුව ප්‍රස්තාර කරන්න.
   " මෙලෙසින් මල් මද දේවියේ "

   iii. උකුසා වන්නමේ අඩව්ව හෝ සෙබළු වෙව්වි තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ අටකුරු ගාහක වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

02. " දේශිය නර්තන කලා ඉතිහාසය මගින් සමාජ හා ආගමික නර්තනයේ විවිධ පැතිකඩ ප්‍රදර්ශනය වේ. "

   i. " ගම්පොළ යුගයේ නර්තන කලාවෙහි භාරතීය ආභාසය ප්‍රදර්ශනය වේ. " පුරාවිද්‍යාත්මක සාධක දෙකක් ඇසුරෙන් තොරතුරු දක්වන්න.

   ii. අනුරාධපුර හා පොළොන්නරු යුගයන්හි නර්තනයෙහි කාන්තා දායකත්වය සාධක දෙකක් ඇසුරින් විමසන්න.

   iii. කොළඹ යුගයේ පටන් වර්තමානය දක්වා නර්තන අධ්‍යාපනය ප්‍රවර්ධනයෙහි ලා පාසල් පද්ධතියට අමතරව තවත් හැර විවිධ ආයතන පුරෝගාමී වී තිබේ.සාධක හතරක් ඇසුරින් පැහැදිලි කරන්න.

## I I කොටස

03. "දේශිය ශාන්තිකර්ම පුද්ගල හා සමාජ විශ්වාසයන් පදනම් කරගත් මනෝ ප්‍රතිකාර ක්‍රියාවලියකි."

   i. සුවිශේෂ චාරිත්‍ර විධි දෙකක් ඇසුරෙන් කිරි මඩුව ශාන්තිකර්මය හා බැඳි ඇදහිලි විශ්වාස විමසුමට ලක්කරන්න.

   ii. වලියක් මංගල්‍යය ශාන්ති කර්මය පැවැත්වීමෙහි ලා පුද්ගල හා සමාජ දායකත්වය හිමිවන ආකාරය විග්‍රහ කරන්න.

   iii. නානුමුරය හා කපුයක්කාරිය පදනම් කර ගනිමින් එහි ක්‍රියාත්මක මනෝ උපදේශන ක්‍රියාවලිය විග්‍රහ කරන්න.

04. " ශාන්ති කර්මයන්හි ප්‍රස්තුතයට යෝග්‍ය වන පරිද්දෙන් පෙළගස්වන ලද නර්තන , ගායන , වාදන හා සැරසිලිඅලංකරණ දක්නට ලැබේ. "

i. සන්නියකුම ශාන්තිකර්මයේ පුරාවෘත්තය හා සම්බන්ධ සුවිශේෂ නර්තන අවස්ථාවක් විස්තර කරන්න.

ii. බලි යාග ශාන්ති කර්මවල ඇදුරාගේ භූමිකාව සතු ශිල්පීය සක්‍යතා රාශියකි විචාරය කරන්න.

iii. කිරි මඩුව ශාන්ති කර්මයේ රංග භූමිය හා රංග සැරසිලි විස්තර කර එහි කලාත්මක ලක්ෂණ අගයන්න.

05. " ගැමි නැටුම් හා ගැමි නාටක , ජන ජීවිතය විනිවිද දැකිය හැකි කැඩපතක් බඳුය."

i. ප්‍රබල ආගමික සබඳතා ප්‍රදර්ශනය වන, ද්‍රවිඩ ගැමි නැටුම් දෙකක සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

ii. ගැමි ජීවන වෘත්තින් හි වෘත්තික ස්වභාවය ගැමි නැටුමෙන් ප්‍රදර්ශනය වන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

iii. කෝලම්කරුවා හාසය හා උපහාසය මතුකිරිමෙහි ලා විවිධ ක්‍රම ශිල්ප යොදා ගන්නා ආකාරය ජස හා නොංචි යන කෝලම්හි චරිත ඇසුරින් විමසන්න.

## I I I කොටස

06. පහත සඳහන් වගුවෙහි (අ) , (ආ) සහ (ඉ) යන කොටස්වලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| තිල්ලානා | ශාකුන්තලාය | 14 වන ලූවි රජු |
| තරාණා | පටාචාරා | 2 වන හෙන්රි රජු |
| ටුම්රි | කල්පනා | මහා පීටර් රජු |
| වර්ණම් | චිත්‍රාංගදා | 8 වන හෙන්රි රජු |

i. (අ) කොටස - කථක් නර්තන සම්ප්‍රදායට අයත් නෘත්‍ය අංගය තෝරා ඒ පිළිබඳ විස්තර කරන්න.

ii. (ආ) කොටස - මේ අතුරින් දේශීය නර්තන නිර්මාණ කෘතිය තෝරා ගෙන එහි කලාත්මකභාවය සඳහා රංගවස්ත්‍රාභරණ හා තාක්ෂණය යොදාගෙන ඇති ආකාරය සාකච්ජා කරන්න.

iii. (ඉ) කොටස - The Sun King යන අන්වර්ථ නාමයෙන් හැඳින්වූ ප්‍රංශයේ රාජ්‍ය පාලකයා තෝරාගෙන බටහිර බැලේ නර්තනයෙහි ලා ඔහුගේ දායකත්වය අගයන්න.

07. සාම්ප්‍රදායික රඟමඩලට වඩා නූතන වේදිකාව තුළ විවිධ සාධනීය ලක්ෂණ දක්නට ලැබේ.

i. " රංග භූමිය" යන්න නිර්වචනය කර ශාන්තිකර්ම රංගභූමිය පිළිබඳ ව විස්තර කරන්න.

ii. නූතන ප්‍රාසාංගික වේදිකාවේ රංග සැරසිලි හා පසුතල නිර්මාණ භාවිතය පිළිබඳ ව විමසන්න.

iii. ශාන්තිකර්ම ආශ්‍රිත ආලෝක කරණය සහ නූතන වේදිකා ආලෝක කරණය පිළිබඳ ව සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.

08. " වර්තමාන සිනමා හා රූපවාහිණී නර්තන නිර්මාණ , සමාජය තුළ විවිධ විචාරයන්ට ලක්ව තිබේ."

i. රියැලිටි වැඩසටහන් දෙකක් නම් කර , ඉන් එක් වැඩසටහනක නර්තන නිර්මාණ පිළිබඳව අදහස් දක්වන්න.

ii. " අධ්‍යතන සිනමා නිර්මාණ නර්තනයෙන් පොහොසත්ය." මේ පිළිබඳව අගයන්න.

iii. රූපවාහිනිය සාම්ප්‍රදායික නර්තනයට අභියෝගයක් ද ? විමසන්න.